**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #December18**

තමන් පළ කරනා වාර්තාවක නිරවද්‍යතාවය සඳහා සෑම සාධාරණ ප්‍රයත්නයක්ම දැරිය යුතු බව පිළිගත් මාධ්‍ය ආචාර ධර්මයකි. මෙම නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු මතුවීම ඇතැම් විට කුඩා මිනිස් දෝෂයක් නිසා වුවද සිදුවීමේ හැකියාවක් ඇත. ඒ සඳහා උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පතේ දෙසැම්බර් 12 දින පළවූ පහත ප්‍රවෘත්තිය දැක්විය හැක. ද්‍රවිඩ ජාතිකයින් 500 ක් අතුරුදන් වීම පිළිබඳ මෙම ප්‍රවෘත්තියේ "2017 මැයි 17 සිට මැයි 19 තෙක් හමුදාවට බාර වූ පිරිස අතුරුදන් වී ඇති බවට විමර්ශන වාර්තාවක් මගින් ජාත්‍යන්තර අධිකරණයට පෙන්නුම් කර තිබේ" යනුවෙන් සඳහන් වේ. කෙසේ වෙතත් Human Rights Data Analysis Group මගින් නිකුත් කර ඇති වාර්තාවේ දැක්වෙන්නේ ඉහත කරුණ සම්බන්ධ කාල පරිච්ඡේදය වන්නේ 2009 මැයි 17 සිට මැයි 19 දක්වා කාල පරාසය බවයි. මෙම වර්ෂයේ වෙනස් වීම කුමනාකාරයක දෝෂයක් නිසා සිදුවූවත්, මෙම වාර්තාව හා බැඳි සියලුම කරුණු යා වන්නේ ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය හා ආශ්‍රිත කාලය වෙත බව සලකා බලන විට, මෙම දෝෂය ඔස්සේ වාර්තාවේ සන්දර්භය වෙනස් නොවන්නේද? එයින් වෙනත් සාවද්‍ය වූ අර්ථයන් පාඨකයා වෙත සන්නිවේදනය නොවන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

(hrdag.org වාර්තාව සඳහා සබැඳිය: https://hrdag.org/wp-content/uploads/2018/12/HRDAG-ITJPSL-2018-12-12-1.pdf)